## 2026 පාසල් පාවහන් වැඩ සටහන

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය හා අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව, කර්මාන්ත අමාත්‍යාංශයේ ලියාපදිංචි දේශිය පාසල් පාවහන් නිෂ්පාදන සමාගම් නවයක් සමඟ නියමු ව්‍යාපෘතියක් ලෙස බස්නාහිර පළාත සහ දකුණු පළාත තුල සිදු කරන ලදී.

2026 වර්ෂයේ දී මෙමඟින් එම පළාත් දෙකෙහි ළමුන් 250ට අඩු පාසල්, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ පාසල්, වතු පාසල් හා පිරිවෙන් වල ගිහි පැවිදි සිසුන් හා සීල මාතාවන් ඇතුළුව 156,041 දෙනෙකු සඳහා පාවහන් යුගලයක් ලබා දිම සිදු කරන ලදී.

2017 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පාවහන් ලබා ගැනිම සඳහා රු.3,000/-ක තිළිණපතක් සිසු දරුවන් වෙත ලබා දී ඇත. එහිදි දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල්වල දරුවන්ට දෙමව්පියන් සමඟ නගර වෙත පැමිණ ලියාපදිංචි නියෝජිතයන් වෙතින් පාවහන් යුගලයක් රැගෙන යාමට සිදු වි ඇත.ඒ හේතුවෙන් දෙමව්පියන්ට අමතර වෙහෙසක් හා වැය බරක් දැරිමට ද සිදු වි ඇත.

දේශිය පාවහන් නිෂ්පාදකයෝ මෙම නියමු ව්‍යාපෘතිය සඳහා මහත් උනන්දුවකින් සහභාගී වු අතර පාවහන් යුගලයක් වසරක වගකිම් කාලයක්ද සහිතව රු.2,100/-මිලකට පාසල වෙත ගොස් සිසු දරුවාගේ අතටම ලබාදිමට ද එකඟ විය. මෙමඟින් රජයට එක් පාවහන් යුගලයකින් රු.900/-ක ඉතිරියක් සිදු වූ අතර එහි සමස්ත ප්‍රතිලාභය රුපියල් මිලියන 140.45කි(156,041x900=140,436,900).එයට අමතරව දෙමව්පියන්ට හා සිසු දරුවන් වෙත ලැබි ඇති වක්‍ර ප්‍රතිලාභ මුදලින් මැනිය නොහැකි තරම් විශාල වේ.

අනිවාර්යෙන්ම ගුණාත්මක තත්ත්වයෙන් යුක්ත සපත්තු යුගලයක් ප්‍රතිලාභී දරුවන්ට ලැබි ඔවුන්ට වඩා සුවපහසු පාසල් කටයුතුවල යෙදිමට අවස්ථාව ලැබිමත්,දේශිය පාවහන් නිෂ්පාදන කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහල යාම මඟින් ඍජු හා වක්‍ර රැකියා උත්පාදනය විමත්, එම පවුල්වල ආදයම් උත්පාදනය හා ජිවනෝපාය සුරක්ෂිත විමත්,දේශිය නිෂ්පාදන භාවිතා කිරිමේ සංස්කෘතියක් රටතුල නිර්මාණය විමත් හා දේශිය පාවහන් කර්මාන්තය ප්‍රවර්ධනය විමේ ප්‍රවණතාවක් ද නිර්මාණය විමත් මේ මඟින් සිදු වේ. ඒසේම රටට අවශ්‍ය දේ රටම තුලම නිෂ්පාදනය විමෙන් විදේශ විනිමය ඉතිරි විමෙන් ජාතික ආර්ථිකය සුරක්ෂිත කිරිමටද මෙම වැඩසටහන දායක වේ.

මේ වනවිට 2027 වර්ෂයේදී ද මෙම වැඩ සටහන දේශිය පාවහන් නිෂ්පාදකයින් දස දෙනෙකුගේ සහභාගීත්වයෙන් බස්නාහිර,දකුණ,නැගෙනහිර, වයඹ හා සබරගමුව පළාත් පහේ ළමුන් 250ට අඩු පාසල්, විශේෂ අවශ්‍යතා සහිත පාසල්, වතු පාසල් හා පිරිවෙන් වල ගිහි පැවිදි සිසුන් හා සීල මාතාවන් ද ඇතුළුව 405,188 දෙනෙකු සඳහා ක්‍රියාත්මක කිරිමට අවශය කටයුතු සිදු කරමින් පවතී.